රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2003

මගේ අංකය : ආ1/4/3/(1)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2003.06.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි නිලධාරීන්ට <u>වැටුප් වර්ධක ලබාදීම</u>

වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරට පැමිණි නිලධාරීන්ට උපරිමයේ රැඳී සිටීම වෙනුවෙන් වැටුප් වර්ධක ලබාදීමට අදාළ 1997.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97(III) හි 5 වැනි වගන්තියෙන් සංශෝධිත 1997.01.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/97 හි 6 වැනි වගන්තියේ 6 : 1, 6 : 2 සහ 6 : 3 විධිවිධාන 1997.01.01 දින සිට ලබාදී ඇති ප්‍රතිලාභවලට අගතියක් නොවනසේ ඉවත් කිරීමටත් ඒ වෙනුවට මෙම චක්‍රලේ'යේ විධිවිධාන එදින සිට ක්‍රියාත්මක කිරීමටත් රජය තීරණය කර ඇත.

02. 2002.12.31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 1997.01.01 දින සිට උපරිම වැටුප් පියවරට එළඹි නිලධාරීන්ට සිය තනතුරට අදාළ වැටුප් පරිමාණයේ අවසානයේ ඇති අගයට සමානව වැටුප් වර්ධක තවදුරටත් වාර්ෂිකව උපයා ගැනීමට ඉඩ දිය හැකිය.

03. 1997.01.01 දින වන විට වසරක් හෝ ඊට වැඩි කාලයක් උපරිම වැටුප් පියවරේ සිටි හා වැටුප් වර්ධකයක් ලබා නොගත් නිලධාරීන්ට එක් වැටුප් වර්ධකයක් 1997.01.01 දින සිට ලබාදෙන අතර,ඉන් අනතුරුව මෙම නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනය වන්නේ ජනවාරි 01 දය. විනය නියෝගයක් මත වැටුප් වර්ධක අහිමි කර ඇති නිලධාරීන්ට මෙය අදාළ නොවන අතර විනය නියෝගය අනුව ක්‍රියා කළ යුතුය.

04. 1997.01.01 දින වන විට වසරකට වඩා අඩු කාලයක් උපරිම වැටුප් පියවරේ සිටින සහ 1997.01.01 දිනට පසුව එම වසර තුළ වැටුප් වර්ධක දිනය යෙදෙන නිලධාරීන්ට විනය නියෝගයක් මත වැටුප් වර්ධක අහිමි කර නොමැති නම් 1997 වර්ෂය තුළ යෙදෙන වැටුප් වර්ධක දිනයේදී එක් වැටුප් වර්ධකයක් ලබාදෙන අතර එම නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනය වෙනස් නොවේ.

05. 1997.01.01 දින හෝ ඊට පසුව දිනට පවතින වැටුප් පරිමාණයන්හි උපරිමයට පැමිණෙන නිලධාරීන්ට උපරිමයට පැමිණීමෙන් පසු සෑම වර්ෂයක් වෙනුවෙන් මෙම චක්‍රලේඛයේ 02 හා 03 ඡේදවල විධිවිධානවලට යටත්ව වැටුප් වර්ධක ලබාදිය හැකිය.

06. ඉහත 03, 04 සහ 05 වන ඡේද අනුව වැටුප් වර්ධක ලබන නිලධාරියකු 1997.01.01 දින සිට 2002.12.31 දක්වා කාලය තුළ උසස්වීමක් ලබා ඇත්නම් සංශෝධිත වැටුප මත වැටුප් පරිවර්තනය කළ යුතු අතර, හිඟ වැටුප් ගෙවිය යුත්තේ 2003.01.01 දින සිටය. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් ක්‍රියාත්මකවීමට පෙර පැවති විධිවිධානයන් මත සිදු කෙරෙන වැටුප් පරිවර්තන යටතේ උසස්වීම ක්‍රියාත්මක වන දිනයේ සිට හිඟ වැටුප් ගෙවීමට බාධාවක් නැත.

07. 1997.01.01 දින සිට 2002.12.31 දින දක්වා කාලය තුළ උපරිම වැටුප ලබමින් සිට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප, ඔවුන් අවසාන වරට වැටුප් වර්ධකය ලැබූ දිනයේ සිට විශ්‍රාම ගැනීම දක්වා කාලයට උපයාගෙන ඇති වැටුප් වර්ධකයේ අනුපාතික කොටස ද සමග ගණනය කර සංශෝධනය කළ යුතු අතර, හිඟ විශ්‍රාම වැටුප් 2003.01.01 දින සිට පමණක් ගෙවිය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් ක්‍රියාත්මක වීමට පෙර, පැවති විධිවිධානයන් යටතේ විශ්‍රාම වැටුප විශ්‍රාම ගිය දින සිට ලබාගැනීමට බාධාවක් නැත.

**08.** ඉහත විධිවිධානවලට පරිබාහිරව 1997.01.01 දිනට පෙර උපරිමයේ රැඳී සිටි සෑම වර්ෂයක් වෙනුවෙන්ම වැටුප් වර්ධක ලබාදීමට ඉඩක් නොමැති බව විශේෂයෙන් අවධානයට ගත යුතු අතර, ඇතැම්විට වසර 01 සිට 03 දක්වා කාලයට වැටුප් වර්ධක එකක් පමණක් ලැබිය හැකිය.

**උදහරණ** : (I) 1994.01.01 දින උපරිමයට පැමිණි නිලධාරියාට මෙන්ම 1996.01.01 උපරිමයට පැමිණි නිලධාරියාට ද 1997.01.01 දින සිට එක් වැටුප් වර්ධකයක් පමණක් ලැබෙන අතර එය විෂමතාවයක් ලෙස සලකනු නොලැබේ.

(II) 1993.01.01 දින වැටුප් පරිමාණයේ උපරිමයට පැමිණීම නිසා 1996.01.01 දින කල්පිත පදනමින් වැටුප් වර්ධකයක් ලබාදී ඇති නිලධාරියකුට 1997.01.01 දින සිට මෙම චක්‍රලේඛය යටතේ වැටුප් වර්ධකයක් ලබාදිය හැකිය.

**09.** උසස්වීමක් ලබන නිලධාරියකු උසස්වීම ක්‍රියාත්මක වන දිනය වන විට නව තනතුරට අදාළ වැටුප් පරිමාණයේ උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් ලබමින් සිටියේ නම් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වැටුප පරිවර්තනය කිරීම සඳහා එකී වැටුප් පරිමාණයට (උසස් වූ තනතුරට අදාළ වැටුප් පරිමාණයට) වැටුප් වර්ධක එකතු කරමින් ගැළපිය යුතුය.

**10.** එක් තනතුරක උපරිම වැටුප් තලය ඉක්මවා වැටුප් ලබමින් සිටි නිලධාරියකු උසස්වීමක් මත සිදු කෙරෙන වැටුප් පරිවර්තනය යටතේද එම තනතුරේ උපරිම වැටුප් තලයට පැමිණේ නම් ඉන් අනතුරුව වැටුප් වර්ධක ලැබීමට සුදුසුකම් ලබන්නේ උසස් වූ තනතුරේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ පසුව වන අතර, තනතුරු දෙකක උපරිමයේ සිටි කාලපරිච්ඡේද ඒකාබද්ධ කර වැටුප් වර්ධක ලබාගත නොහැකිය.

11. මෙම චක්‍රලේඛයේ විධිවිධාන මත 1997.01.01 දින සිට අදාළ වැටුප් පියවරයන්හි පිහිටුවිය හැකි නමුත් 2002.12.31 දක්වා කාලපරිච්ඡේද සඳහා හිඟ වැටුප් හිමි නොවේ.

12. මෙතෙක් පැවති විධිවිධානයන් මත 1997.01.01 දිනට පසු උපරිමයේ රැඳී සිටීම වෙනුවෙන් ගෙවා ඇති වැටුප් වර්ධක වෙනුවට මෙම චක්‍රලේඛයේ විධිවිධාන ආදේශ වන බැවින් එකම දිනට වැටුප් වර්ධක දෙකක් ලබා නොදිය යුතුය.

13. මෙම වැටුප් වර්ධක ලබාදීමේදී ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 10 වගන්තියේ නියම කර ඇති විධිවිධාන අදාළ කරගත යුතුය.

14. මේ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා නොදෙන බැවින් පවතින ප්‍රතිපාදන උපයෝගී කරගත යුතුය.

15. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

බී.ජේ.කරුණාරත්න
ආයතන අධ්‍යක්ෂ ජනරාල්